සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සති පාසල

| 10 - ශ්‍රේණිය | නර්තනය | ඔක්තෝබර් 4 වන සතිය |
|---|---|---|

1. නිපුණතාවය :- ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායන් හා සබැඳි ඓතිහාසික හා සංස්කෘතික පසුබිම අධ්‍යයනය කරමින් ජාතික උරුම රැක ගැනීම සඳහා ක්‍රියා කරයි

නිපුණතාමට්ටම :- ශ්‍රී ලාංකේය නර්තන සම්ප්‍රදායන් හා සබැඳි ශාන්තිකර්මවල සුවිශේෂ ලක්ෂණ තුලනාත්මකව අධ්‍යයනය කරයි

විෂය සන්ධාරය / පාඩම :- කොහොඹා යක් කංකාරිය, දෙවොල් මඩුව හා පහන් මඩුව ශාන්තිකර්ම පිළිබඳ තොරතුරු තුලනාත්මක ව ඉදිරිපත් කරමු.

2. ඉගෙනුම් ඵල:-

- කොහොඹා යක් කංකාරිය දෙවොල් මඩුව පහන් මඩුව ශාන්ති කර්ම හා සබැඳි කතා පුවත්වල අන්තර්ගත සමාජ ආකල්ප විස්තර කරයි.
- ශාන්තිකර්ම පැවැත්වීමේ අරමුණු දක්වයි.
- ශාන්තිකර්මවල සංස්කෘතික වැදගත්කම පැහැදිලි කරයි.
- එම ශාන්තිකර්මවල අන්තර්ගත ගායන වාදන නර්තන වස්ත්‍රාභරණ සැරසිලි හා රංග භාණ්ඩවල සුවිශේෂ ලක්ෂණ තුලනාත්මක ව ඉදිරිපත් කරයි.
- ශාන්තිකර්ම වල එන පුරාවෘත්ත කතා මගින් දෙන පණිවුඩ හා එහි ඇති සාරධර්ම තුළින් ආදර්ශ ගෙන තම ජීවිතය යහපත් ලෙස හැඩගස්වා ගනී.
- එකමුතුකම සමගිය හා සමානාත්මතාවය යන ගුණාංග වර්ධනය කර ගනී

3. ශිෂ්‍යයා කලයුතු කාර්යයන් :-

දුවේ පුතේ ඔබ 7 8 9 ශ්‍රේණිවල දී කොහොඹා කංකාරිය දෙවොල් මඩුව පහන් මඩුව පිළිබඳව වෙන වෙනම තොරතුරු අධ්‍යනය කළා. අද අපි 10 ශ්‍රේණියේදී මෙම තොරතුරු සියල්ලම එකම පාඩමකින් අධ්‍යනය කිරීමට බලාපොරොත්තු වෙනවා. ඔබ කලින් පාඩම් වලදි ඉගෙන ගත්ත ශාන්තිකර්ම ආශ්‍රිත චාරිත්‍ර විධි, ගායන, වාදන, නර්තන, සැරසිලි පිළිබඳව මදක් කල්පනා කර බැලුවහොත් ඔබට පෙනේවි ඒවායේ ඇති සමානතා, අසමානතා හා සුවිශේෂ ලක්ෂණ.

උදාහරණ:-

දේශීය ශාන්තිකර්ම වල එන උපත් කතාවල ඇති සමාන අසමානතා ලක්ෂණ මම ඔබට පෙන්වා දෙන්නම්,

| සමානතා | අසමානතා |
|---|---|
| * දෙවොල් මඩු පහන් මඩු ශාන්තිකර්ම දෙකෙහිම පුරාවෘත කතාව එකක් වීම.<br>* ශාන්තිකර්ම ත්‍රිත්වයහිම පුරාවෘත්ත කතා මගින් සමාජයට යම්කිසි පණිවිඩයක් ලබා දීම.<br>*පුරාවෘත්ත කතාවල එන පරිදි ශාන්තිකර්ම තුනම ලෙඩ රෝග සුවකර ගැනීමට පැවැත්වීම | * මඩු ශාන්තිකර්මවල එන පුරාවෘත කතා එකක් වන අතර (සේරමන් රජු කතා පුවත) කොහොඹා කංකාරියේ එය වෙනස් වීම ( විජය කුවේණි කතා පුවත).<br>* කොහොඹා කංකාරියට දේශීය රජුන් මුල් වන අතර මඩු ශාන්තිකර්මවලට භාරතීය රජකු මුල් වීම.<br>* මඩු ශාන්තිකර්මවල සත්ව චරිතයක් සම්බන්ධවීම (ගෝනා). කොහොඹා කංකාරියේ කාන්තාවක් සම්බන්ධ වීම (කුවේණි) |

**දුවේ පුතේ මේ අනුව සිතා බලා පහත ක්‍රියාකාරකම කරන්න.**

## “ශාන්තිකර්ම වූ කලී දේශීය නර්තන කලාවේ අනන්‍ය ලක්ෂණ පිළිබිඹු කරන සාධකයකි”

1. කොහොඹා කංකාරි පුරාවෘත්ත කතාව මගින් සමාජයට ලබා දෙන උපදේශය පිළිබඳ කෙටියෙන් පැහැදිලි කරන්න.
   ( දූවේ පුතේ ඔබට මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමට මහාචාර්ය මුදියන්සේ දිසානායක මහතාගේ කොහොඹා යක් කංකාරිය හා සමාජය යන පොත කියැවීමෙන් තොරතුරු ලබාගත හැක.)

2. දේශීය ශාන්තිකර්ම පැවැත්වීමේ අතීත අරමුණු හා වර්තමාන අරමුණු වෙන වෙනම ලියා දක්වන්න.

3. ශාන්තිකර්ම ත්‍රිත්වයටම පොදු චාරිත්‍ර විධි තුනක් නම් කරන්න.

## “දේශීය ශාන්තිකර්ම ත්‍රිත්වයේ සමාන මෙන්ම අසමාන ලක්ෂණ ද දක්නට ලැබේ”

4. දෙවොල් මඩුවේ හා පහන් මඩුවෙ එන නාට්‍යමය පෙළපාලි වල සමානතා හා අසමානතා ලක්ෂණ වෙන වෙනම ලියන්න.

   (ඔබට යූ ටියුබ් නාලිකා වල තිබෙන ශාන්තිකර්ම ආශ්‍රිත නාට්‍යමය පෙළපාලි පිළිබඳ සොයා බැලුවොත් මීට තව තොරතුරු එකතු කරගත හැක)

5. ඔබ කැමති ශාන්තිකර්ම දෙකක නර්තන සම්ප්‍රදායන්ට අයත් වාද්‍යභාණ්ඩ 2ක ව්‍යුහය හා සැකැස්මේ ඇති සමානතා ලක්ෂණ පෙන්වා දෙන්න.

   (7, 8, 9 නර්තනය අතිරේක කියවීම් පොත් පරිශීලනය මගින් ඔබට මෙම ප්‍රශ්නයට පිළිතුරු ලිවීම පහසු වනු ඇත)

6. ඔබ උගත් එක් දේශීය ශාන්ති කර්මයක සැරසිලි හා එයට පරිසරයෙන් ලබා ගන්නා අමුද්‍රව්‍ය පිළිබඳ විස්තර කරන්න.

7. සම්ප්‍රදායන් ත්‍රිත්වයට අයත් ගායන සහිත හා ගායන රහිත නර්තන අංග දෙක බැගින් ලියන්න.

8. කොහොඹා කංකාරි ශාන්ති කර්මය පුද ලබන දෙවිවරු දෙදෙනෙක් හා යකුන් දෙදෙනකු නම් කරන්න.

9. “දේශීය ශාන්තිකර්ම තුළින් එකමුතුකම සමගිය සමානාත්මතාවය ගුණාංග අප තුළ වර්ධනය කරයි” ඉහත කියමන පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

## ක්‍රියාකාරකම:-

දූවේ පුතේ කාර්යය පත්‍රිකාව සම්පූර්ණ කිරීමේදී ඔබට සමාන අසමානතා ලිවීමට ඇත. එහිදී චාරිත්‍ර විධි වල, පුරාවෘත්ත කතාවල, රංගවස්ත්‍රාභරණ වල, ඒවා සැකසීමේදී භාවිත ද්‍රව්‍ය වල, වර්ණ වල තිබෙන සමානතා හා අසමානතා ආදි කරුණු පිළිබඳ අවධානය යොමු කර කරන්න

.

උදාහරණ:-

ශාන්තිකර්ම ත්‍රිත්වයෙහි ම සැරසිලිවලට පරිසරයෙන් ලබා ගන්නා අමුද්‍රව්‍ය භාවිත කිරීම, සම්ප්‍රදායන් තුනේම සමාන චාරිත්‍ර විධි තිබේ. කප් සිටුවීම, මඩු පේ කිරීම, තොට පේ කිරීම ආදිය.

# කාර්ය පත්‍රිකාව

| | කොහොඹා යක් කංකාරිය | දෙවොල් මඩුව | පහන් මඩුව | සමානතා | අසමානතා |
|---|---|---|---|---|---|
| පැවැත්වීමේ අරමුණු | | | | | |
| පුද ලබන දෙවිවරු හා යකුන් | | | | | |
| නර්තන අංග | | | | | |
| ගායන අංග | | | | | |
| වාදන අංග | | | | | |
| රංග භාණ්ඩ | | | | | |
| රංග වස්ත්‍රාභරණ | | | | | |
| ප්‍රධාන සැරසිලි | | | | | |

## 4. ඉහත ක්‍රියාකාරකම් සඳහා උපකාරී කරගත හැකි පොත් පත්, වෙබ් අඩවි හා ඉගෙනුම් ආධාරක :-

"දුවේ පුතේ ඔබට පහත සඳහන් වෙබ් අඩවි බැලුවොත්, පොත්පත් කියෙව්වොත්, මේ පාඩමට අදාළව තව ගොඩක් තොරතුරු එකතු කරගන්න පුළුවන් "

i . e - තක්සලාව - නැත

ii. e - නැණ පියස :- https://www.enenapiyasa.lk/lms/course/view.php?id=96#section-24

iii. ගුරු ගෙදර :- නැත

iv. වෙනත් :-

youtube නාලිකා

- බෞද්ධයා මාධ්‍ය ජාලය - https://youtu.be/qiNd8NmJ9RQ
- පුලකි නර්තන අධ්‍යාපන ආයතනය ( pulaki dancing academy ) - https://youtu.be/EZ7TnWWQSNc
- [Pubudu Gamage Drama Team]නාට්‍ය හා රංග කලාව - https://youtu.be/othUROGN5xM

v. පොත් පත්:-

- සිංහල ගැමි නාටකය - මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර මහතා.
- ශාන්තිකර්ම හා සිංහල සමාජය - මහාචාර්ය තිස්ස කාරියවසම් මහතා.
- කොහොඹා යක් කංකාරිය හා සමාජය - මහාචාර්ය මුදියන්සේ දිසානායක මහතා.
- නර්තනය අතිරේක කියවීම් පොත 10 ශ්‍රේණිය - ජාතික අධ්‍යාපනික ආයතනය.

*"ආදරණීය දුවේ පුතේ ඔබට මෙම පාඩම ඇසුරෙන් සකසන ලද "word wall"* ක්‍රියාකාරකමට දැන් යොමු වන්න. ඒ සඳහා පහත link එක භාවිත කරන්න"

https://wordwall.net/play/19192/054/595

සැකසුම :- K.P.S.C. වීරසිංහ තනතුර:- ශ්‍රී ලංකා ගුරු සේවය , 2 – 1

අධ්‍යාපනික ආයතනය :- කෑ/දෙහි/ වැගල්ල කණිෂ්ඨ විද්‍යාලය